# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,495 - 2026 ජුනි මස 26 සිකුරාදා - 2026.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — | පිස්කල් විකිණීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... | 162 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | | |


*සැ. යු.* - (i) අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 17 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 03 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


161 - B 082804 — (2026/06)
C 1 -

# විවිධ දැන්වීම්

**පාර්ලිමේන්තුව**

වාසස්ථාන හා සම්පත් සංවර්ධන සංවිධානය (Organization for Habitation and Resources Development) සංස්ථාගත කිරීම සඳහා වූ පනත

මම, රිෂාඩ් බදියුදීන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "වාසස්ථාන හා සම්පත් සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත" නමැති පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

මෙම පනත් කෙටුම්පතේ අරමුණ වන්නේ පහත සඳහන් පොදු අරමුණු ඇති එම සංවිධානය සංස්ථාගත කිරීමයි.

- නිවාස නොමැති පවුල් සඳහා නවාතැන් පහසුකම් සැපයීම.
- අවශ්‍යතා ඇති පවුල් සඳහා සහන, පුනරුත්ථාපන හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර සහ ඒවා තුළ ජනවාර්ගික සහජීවනය ප්‍රවර්ධනය කිරීම සහ සාමය වර්ධනය කිරීම.
- බලය බෙදාහදා ගැනීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියන් හි ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ශක්තිමත් කිරීම.
- අපගේ කාර්යයන් සඳහා අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේ අරමුණින් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ ජාලගතව කටයුතු කිරීම.
- කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

රිෂාඩ් බදියුදීන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
වන්නි දිස්ත්‍රික්කය.

06 - 373

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.